# පැරණි ලංකාවේ මානව හිමිකම් සුරක්ෂාව පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති සැකසුම තිරසර සංවර්ධනය උදෙසා සිදුකළ බලපෑම පිළිබඳ විමසුමක් (රජරට සභ්‍යත්වය ඇසුරින්)

මධුෂාණි ඩබ්ලිව්.ඒ.ඩී.වී.[1]

අපේ රටේ පාලකයන් මානව හිමිකම් සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලියේදී අතීතයට මෙන්ම වර්තමානයට හා අනාගතයට ද එකසේ වැදගත් වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය කරන ලදී. පැරණි ලංකාවේ මානව හිමිකම් සුරක්ෂාව පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති සැකසුම තිරසර සංවර්ධනය උදෙසා සිදුකළ බලපෑම පිළිබඳ විමසුමක් මෙම අධ්‍යනයෙන් සිදු කෙරේ. නූතන නීති ක්‍රමයන්ගේ අතීත භාවිතාව හා ඒවා රටේ සංවර්ධනයට යොදා ගත හැකි ආකාරය විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. තිරසාර සංවර්ධනය සඳහා මානව අයිතීන් පදනම් කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය මඟින් සිදු වන බලපෑම කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යොදා ගත් අතර සපයාගත් දත්ත සන්සන්දනාත්මකව හා විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹී තිබේ. මානව අයිතීන් මිනිසාට උපතින්ම හිමිවන්නකි. පුරාතන මිනිසාගේ සාගින්න තුරන් කිරීම උදෙසා මූලික අවශ්‍යතාවයක් වන ආහාර නිෂ්පාදනය කිරීමට, ආහාර සුරක්ෂිත කිරීමට, ආහාර සැමට ප්‍රමාණවත් ලෙස බෙදී යෑම උදෙසා විවිධ වූ රාජ්‍ය ප්‍රතිපත්තීන් රජරට අවධිය තුල ක්‍රියාත්මක වූ බවට සාධක මහාවංශයේ මෙන්ම තෝනිගල, බදුලු ටැම් ලිපිය ආදී සෙල්ලිපි මූලාශ්‍රයයන් තුලින් සාධක හමුවේ. තවද දරිද්‍රතාව දුරලීම උදෙසා රැකියා අවස්ථා තිබූ බව ජේතවනාරාම සංස්කෘතික ලිපියේ " ආරාමාභ්‍යන්තර කර්ම (කාරකෙඃ) පඤ්චකොලිකොරව ප - රිච්ඡිද්‍ය කර්ම ග්‍රහීතව්‍යම්" පාඨයෙන් තහවුරුවේ. තවද මෙකල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ද පැවති බව මහාවංශයෙන් සාධක හමුවේ එනම් රාජ්‍යයත්වය ස්ථාවර කිරීමට උපදෙස් ලබාදීම, රාජ්‍යයත්වය සඳහා පාලකයෙකු නොමැති වූ අවස්ථා වලදී රාජ්‍ය ස්ථාවර කිරීමට රාජකීය කාන්තාවන් විසින් සිදු කර ඇත. එකල සියලු දෙනාටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය තිබූ බව වසභ රජුගේ බිසවගේ උපස්ථායිකාවක් ප්‍රතිකර්ම දැන ගැනීම උදෙසා මහා පදුම තෙරුන් වෙත පිටත් කළ බව සමන්තපාසාදිකාවේ සඳහන් වීමෙන් අනාවරණය වේ. තවද යුක්තිය හා නීතිය ද, සෞඛ්‍ය සම්පන්න හා යහපත් ජීවිතයක් ගත කිරීම උදෙසා රෝහල් පහසුකම් තිබූ බවත් සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අයිතින් රාජ්‍ය ප්‍රතිපත්තින් තුළින් සලසා තිබූ බවට වෙස්සගිරිය පුවරු ලිපියෙන් සාධක හමුවේ. දේශපාලන අර්බුද වැනි අර්බුද කොතෙරම් පැවතිය ද රාජ්‍යයේ තිරසර සංවර්ධනට උදෙසා ගෙන ගිය රාජ්‍ය ප්‍රතිපත්තින් ඒ අයුරින්ම ක්‍රියාත්මක වූ බව මෙමඟින් පැහැදිලි වේ.

**මුඛ්‍ය පද :** ආර්ථික, ආහාර, මානව අයිතින්, තිරසර සංවර්ධනය, රාජ්‍ය ප්‍රතිපත්තින්

[1]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. vasana.madushani@gmail.com